# උඩරට රාජකීය ලීමගහකොටුවේ වෙද පරම්පරාව

පාරම්පරික වෛද්‍ය වෛද්‍යරත්න මුදියන්සේලාගේ බදුර්දීන් මොහොමඩ් මහරුෆ්

1536 ගම්පොළ රාජධානියේ හතරවන බුවනෙකබාහු රජුගේ රජබිසවට නාඩි කියන ලද මුත්තනුවන් කෙනෙකුගෙන් මෙම ලීමගහකොටුවේ වෙද පරම්පරාව පැවැත එයි. මුල් ම වෛද්‍යවරයා නාඩි ශාස්ත්‍රයේ ප්‍රවීණයෙකි. දැනට විශේෂිත ප්‍රතිකාර ලෙස පක්ෂාඝාත රෝගය සඳහා ප්‍රතිකාර කරනු ලැබේ.

**ප්‍රතිකාරයේ විශේෂතා**

1. කථනය, අංග චලනය, අක්‍රාන්ත ප්‍රදේශය හා මුඛයෙන් ඖෂධ ඇතුළු කළ හැකි ද යන්න මුලින් ම පරීක්ෂා කර බලයි.
2. සිහිවිසංඥ වීම, අංග චලන රහිත වීම, කථනය නොමැති වීම හා නාඩි පරීක්ෂාව මගින් රෝගියාගේ සාධ්‍ය, අසාධ්‍ය බව තීරණය කරනු ලැබේ.
3. කථනය නොමැති නම්, සිහිවිසංඥ වී ඇත්නම්, අංග චලන රහිතනම්, රෝගියා දින 13කට වඩා ජීවත් නොවේ. දින 3, 7, 9, 13 ඇතුළත රෝගියා මිය යා හැක.
4. එසේ නොමැති රෝගීන්ට ප්‍රතිකාර සිදු කිරීමට කටයුතු කරයි.
5. පක්ෂාඝාතය නිසා කථන හැකියාව නොමැති වූ රෝගීන්ට කථන හැකියාව ලබා දිය හැකිය.
6. කිසිම ප්‍රතිකාරයක් සිදු නොකර මුලින් ම පැමිණෙන රෝගියෙකු දින 13කට වඩා ජීවත් වේ නම් කිසිදු උපද්‍රවයකින් තොර ව මුලින් සිටි තත්ත්වයට පත් කළ හැකි ප්‍රතිකාර ක්‍රමයක් පවතී.

**ප්‍රතිකාර**

- මුඛයෙන් සෙම ගලන, කථනය අපහසු අවස්ථාවල දී දිම්බිජ්ජු, කිකිළි බිත්තර කටු මව් කිරෙන් අඹරා දිවෙහි ආලේප කිරීමෙන් සෙම ඉවත් වී කථනය පහසු වේ.
- ප්‍රතිකාර ආරම්භයට පෙර විරේක කළ යුතුය. ඒ සඳහා සැප විරේක චූර්ණය රාත්‍රියට ලබා දෙයි. අරළු, සෙනෙහෙ කොළ, මුද්දරප්පලම්, තිරස්සවාලු යොදා එය සාදා ගනී.
- ඉන් පසුව මාතාබෘහතී දලු අනුපානයෙන් සීතාරාම ගුලිය දින 03ක් ලබා දෙයි.
- මුලින් ම සෙම ප්‍රධාන කොට ගනිමින් කෂාය යොදයි.
- මුල් අවස්ථාවේ සිට ම තෙල් ගා තැවීම සිදු කරන අතර සන්නි බස්න තෛලය නමැති පාරම්පරික තෛලය හා මී පොතු තැවිල්ල, ඇට තැවිල්ල වැනි ස්නිග්ධ තැවිලි භාවිත කරයි.
- මුල් අවස්ථාවේ දී සන්නි බස්න තෛලය ආලේප කිරීමට මෙන් ම පානය කිරීම සඳහා ද යොදයි. පානයට දීමේ දී ඉඟුරු, සුදුළූණු කොටා ගත් යුෂ තේ හැඳි 1/2ක් සමග තෙල් මිශ්‍ර ව ලබා දෙයි.
- අරිෂ්ට වර්ග මෙන් ම අර්ක වර්ග ද මේ අතරට යොදයි.
- දින 03ක් මෙම ප්‍රතිකාර කරන විට හොඳ අතට හැරේ නම් දින 15ක් පමණ මෙම ප්‍රතිකාර ම ලබා දෙයි. ප්‍රතිඵල රහිත නම් දෝෂ තත්ත්වය සලකා බලා ප්‍රතිකාර වෙනස් කරයි. එහි දී කිරි කෂාය මෙන් ම පෝෂණ කෂාය ද යොදා ගනී. කිරි සමග සිඳවා ගනු ලබන කෝරණ්ඩ කෂාය මීන් විශේෂ වේ.
- අවසානයේ රසායන ඖෂධ භාවිත කරයි. ඒ සඳහා ඡාගල්‍යාදිය, රණහංස රසායනය ආදිය යොදා ගනී.

**සන්නි බස්න තෛලය**

කොට්ටපොල්, දිමිබිජු, වවුල් වසුරු ආදී වශයෙන් ඖෂධ වර්ග 150කට අධික සංඛ්‍යාවක් මෙහි දී යොදා ගනී.
ඖෂධ වර්ග සියල්ල වේළා කුඩුකර හලා ගත් චූර්ණය එකට මිශ්‍ර කර වණ්ඩුවේ තම්බා පැහැට දමා පස්පටල යන්ත්‍රයෙන් මිරිකා ගනී. මෙය ආවේණික පාරම්පරික තෛලයකි.

මෙම ප්‍රතිකාර පද්ධතිය සිදු කිරීමෙන් නැවත ඇති නොවන පරිදි මාස 03ක් ඇතුළත නිට්ටාවට ම රෝගය සුව කර ගත හැක.